5

# විවිධාර්ථවත් පද

වෙනත් භාෂාවල මෙන් ම සිංහල භාෂාවේ ද භාවිත වන වචනවල අදහස වටහා ගත යුතු වන්නේ බොහෝවිට එම වචන යෙදෙන පරිසරය අනුව ය. එක ම වචනයකට විවිධ තේරුම් මෙන් ම එක ම තේරුම තිබෙන වචන කිහිපයක් ම යෙදෙන අවස්ථා ද සිංහල භාෂාවෙහි තිබේ. යම් වචනයක් සමග යෙදෙන පරිසරය නැතහොත් එම වචනය සමග යෙදෙන අනෙකුත් වචනවල ද අදහස අනුව අපට අවශ්‍ය වචනයෙහි අදහස වටහා ගත යුතු ය.

## 1 සමානාර්ථ පද

එක ම තේරුමකින්, අදහසකින් යෙදෙන වචන යි.

'සමානාර්ථ පද ඉගෙන ගත යුතු ඇයි ?' යන පැනයට පිළිතුරු සෙවීමේ අදහසින් පහත වැකිය දෙස අවධානය යොමු කරන්න.

"ක්‍රිස්තු වර්ෂ 2012ක් වූ පෙබරවාරි මස 14 වැනි බුද දින එනම් බදාදා දින ඉර උදාව සිදු වන්නේ පූර්වභාග 6. 06ට වන අතර ඉර බැසීම සිදු වන්නේ අපරභාග 6.13ට ය....."

ජ්‍යෝතිෂවේදියකු විසින් දිනයේ ඵලාඵල ප්‍රකාශ කිරීම ආරම්භ කරමින් ඉහත වැකිය පවසන ලදි. එම වැකියෙහි ම ඉර යන පදයට ම සමානාර්ථයක් දෙන පදයක් වූ 'දිනමිණ' යන වචනය යොදා කියවා බලන්න.

එවිට "ක්‍රිස්තු වර්ෂ 2012ක් වූ පෙබරවාරි මස 14 වැනි බුධ දින එනම් බදාදා දින දිනමිණ උදාව සිදු වන්නේ පූර්වභාග 6. 06ට වන අතර දිනමිණ බැසීම සිදු වන්නේ අපරභාග 6.13ට ය....."


*නොමිලේ බෙදාහැරීම පිණිස ය.*

යනුවෙන් කියවේ. සමාන අරුත් ඇති වචන දෙකක් වුවත් යෙදෙන සෑම පරිසරයකට ම එක සේ නොගැළපෙන බව දැන් ඔබට මනා ව වැටහෙනු ඇත. එබැවින් ඒ ඒ තැනට නියමිත සුදුසු ම වචනය භාවිතයට ගැනීමට නම් එම වචනවල අර්ථය පිළිබඳ ව මෙන් ම යෙදෙන පරිසරය පිළිබඳ ව ද වැටහීමක් තිබිය යුතුය. ඔබේ මවුබස වූ සිංහල භාෂාව මෙවැනි සමානාර්ථ යෙදුම් බොහෝවකින් පොහොසත් වී තිබීම ඔබට අභිමානය දනවන කරුණකි. ඒ අභිමානයෙන් යුතු ව සමානාර්ථ පද පිළිබඳ මනා දැනුමක් ලබා ගැනීම ඔබේ යුතුකමකි. එමගින් ලිපි ලිවීමට, වාර්තා සැකසීමට, හිටිවන කවි තැනීමට ආදී විවිධ අවස්ථාවන්ට ගැළපෙන වචන තෝරා ගැනීම සඳහා හැකිතාක් සමාන පද ඔබ දැනුම් ගබඩාවේ පුරවාගෙන එදිනෙදා භාවිතයට ගැනීම සිදු කළ යුතු යි. නාම පදවලට මෙන් ම ක්‍රියා පදවලට ද සමානාර්ථ පද තිබෙන බව ද මෙහි දී අමතක නොකළ යුතු ය.

උදාහරණ :

| | | |
|---|---|---|
| ඉපදුණා | = | ජනිත වුණා, බිහි වුණා |
| මැරුණා | = | මියගියා, පරලෝ ගියා, කාලක්‍රියා කළා |

## 2 විරුද්ධාර්ථ පද

නාම පද, ක්‍රියා පද ආදි වශයෙන් වූ යම් පදයකට විරුද්ධ අදහසක් ගෙන දෙන පද විරුද්ධාර්ථ පද නම් වේ.

ඉහත සමානාර්ථ යෙදුම් පිළිබඳ කරන ලද පැහැදිලිකිරීම් අනුව සිංහල භාෂාවේ මෙවැනි විරුද්ධාර්ථ වචන ද බෙහෙවින් ඇත. ඒ වචන දැනගෙන ඔබේ වාක් කෝෂය පුළුල් කර ගැනීම මගින් නොපැකිල කථා කිරීමටත්, ලිවීමේ දී රසවත් ව නිරවුල් ව අදහස් ප්‍රකාශ කිරීමටත් හැකි වේ.

| | | |
|---|---|---|
| පිං | - | පව් |
| ඉපදෙන | - | මැරෙන |
| පිරිසිදු | - | අපිරිසිදු |
| අහස | - | පොළොව |
| අව්ව | - | වැස්ස |
| රය | - | දහවල |






නොමිලේ බෙදාහැරීම පිණිස ය.

3 බහ්වර්ථ පද

'බහු' යනු 'බොහෝ ', 'සමූහයක් ' යන තේරුමක් ගෙන දෙන්නකි. 'අර්ථ' යනු 'තේරුම්' ය. ඒ අනුව 'බහු අර්ථ' හෙවත් 'බහ්වර්ථ' යනු 'බොහෝ තේරුම්' ය. බොහෝ අර්ථ සඳහා එක ම පදය නැතහොත් වචනය යෙදෙන පද බහ්වර්ථ පද වේ.

'සොරු දන පැහැර යෙත්
සුදන දන මන පැහැර යෙත් '

මෙහි මුල් පේළියේ දන යනු ධනය හෙවත් වස්තුව යන අර්ථයෙන් යෙදුණු පදයකි. එම පදය ම දෙවැනි පේළියෙහි යෙදී ඇත්තේ ජනතාව යන අදහසිනි. මේ ආකාරයට එක ම පදයක්, අකුරුවල ද වෙනසක් නොමැති ව යෙදෙන පරිසරය අනුව බොහෝ අරුත් නියෝජනය කරන අවස්ථා ඇති බව පෙනී යයි. එවැනි බොහෝ තේරුම් ඇති බහ්වර්ථ පද රැසක් සිංහල භාෂාවේ දක්නට ඇත.

## කුසලතා වර්ධනයට:

1. පහත සඳහන් පදවලට සමාන පද අවම වශයෙන් එකක් බැගින් හෝ ලියා දක්වන්න.

| | |
|---|---|
| මව | පිපෙනවා |
| පියා | සෙලවෙනවා |
| ඉර | බොනවා |
| හඳ | නැටුම |
| ගස් | භාවනාව |
| පොත් | නිවන |

2. i පහත සඳහන් වැකිවල ඉරි ඇඳි පදවලට විරුද්ධාර්ථ දෙන පද හිස්තැන්වල ලියන්න.
ii එම වැකිවල ම වර්ණ ගැන්වූ වදන්වලට විරුද්ධාර්ථ දෙන පද වරහන් තුළ ලියන්න.

- ♦ මත්ද්‍රව්‍ය භාවිතයෙන් සතුටක් ලැබෙන්නේ යැයි අඥාන මිනිසුන් සිතුව ද සැබවින් ම ලැබෙන්නේ .................... කි. (        )
- ♦ භික්ෂූන් වහන්සේගේ සිවුර සරල බවේ ප්‍රධාන ම සංකේතයක් වන නමුත් බැලූ බැල්මට ඉන් පෙනෙන්නෙ .................... මැහුම් රටාවකි. (        )
- ♦ සිංහල සාහිත්‍යය සතු ව පැරණි සම්භාව්‍ය ගද්‍ය සාහිත්‍යයක් හා .................... සාහිත්‍යාංග තිබේ. (        )
- ♦ හිරු බැස යත් ම අහසේ නැගි .................... සිය සෞම්‍ය රැස් දහරින් ගං දිය නැහැවී. (        )

3. i පහත සඳහන් විවිධ අර්ථ ගෙන දෙන වදන් හෙවත් බහ්වර්ථ පද සහිත වැකිවල දැක්වෙන ඉරි ඇඳි බහ්වර්ථ පදයේ අර්ථය, එම පදය යෙදී ඇති වාක්‍යයේ අදහසට අනුව වරහන් තුළ ලියා දක්වන්න.

උදාහරණ : දිය

- දිය ගොඩ සැම තැන කිරි ඉතිරේ. (ජලය)
- ඡන්දදායකයා සිය ඉල්ලීම ඉටු කර දිය හැකි දැයි මන්ත්‍රීවරයාගෙන් ඍජු ව ම ප්‍රශ්න කළේ ය. (දීම)
- දිය දම් නිති කැරකේ. (ලෝක)

පා

- හැකරැල්ලා බහුපා සත්ත්වයකු වන අතර හරකුක්කා පා නොමැති උරග වර්ගයට අයත් සතෙකි. (...................)
- කුඨ ව්‍යාපාරිකයෝ සිනහ මුහුණක් පා පාරිභෝගිකයන් නොමග යවති. (...................)
- සිදුහත් තවුසා සිය පාත්‍රය උඩු ගං බලා පා කර හැරියේ ය. (...................)

දද

- 64 වෙනි නිදහස් උළෙල දා සිරිලක් අහස් කුස සිසාරා නැගි සිහ දද එක්සේසත් රටක මහිමය ලොවට පෙන්වී ය. (...................)
- සිරුරෙහි හට ගන්නා දද නිසා රෝගීහු කායික වේදනාවක් මෙන් ම දැඩි මානසික පීඩාවක් ද විඳිති. (...................)
- නිවට දද පුරුෂයන් දෙස ප්‍රඥාවන්තයෝ සැම විට ම දයා සහිත දෘෂ්ටියකින් බලති (...................)

සඳ

- කන්ද කපා පායන් රන් පුන් සඳ. (...................)
- සකි සඳ පෙනේ සමනොල ගල නැගෙනහිර. (...................)
- දෙව්රම් වෙහෙරෙහි බුදු හිමි වැඩ හිඳි සඳ බොහෝ දන පින් රැස් කර ගත්හ. (...................)

4. පහත සඳහන් කාව්‍ය නිර්මාණය කියවා රස විඳ අසා ඇති ප්‍රශ්නවලට ද පිළිතුරු සපයන්න

### මගේ රට

පෙරදිග ලෝකයේ බබළන මුතු ඇටය
පණ ඇති මහා සමුදුර පවුරෙන් වටය
හෙළ දිවයින මගෙයි මා ඉපදුණ රටය
ලොව අන් සියලු දිවයින් මේකට යටය

මහවැලි-කැලණි-වලවේ-කළු යන ගංගා
සමනල කන්ද මුදුනේ සිට පැන නැංගා
බෑවුම් තැනිතලා හෙල් අතරින් රිංගා
මේවා ගලයි මිණි කැට දිය යට හංගා
. . .

*-පී. බී. අල්විස් පෙරේරා*

(අ) ''පෙරදිග ලෝකයේ බබළන මුතු ඇටය'' යනුවෙන් මෙහි හැඳින්වෙන්නේ කුමක් ද?

(ආ) පණ ඇති සේ සලකා ඇත්තේ කුමකට ද?

(ඇ) මා ඉපදුණ රට වශයෙන් දක්වා ඇත්තේ කුමක් ද?

(ඈ) 'කිසි දු රටකට හෙළ දිවයින නොදෙවෙනි ය' යන අදහස කියවෙන කවි පද පේළිය ලියා දක්වන්න.

(ඉ) මෙහි කියවෙන ගංගා හතරේ නම් මොනවා ද?

(ඊ) මෙය සරල වචන යොදා ගනිමින් ලියූ ඉතා අරුත්බර ගීයකි. ඔබත් ඔබේ රට ගැන මෙවැනි රසවත් කවි නිර්මාණ කරන්න.

(උ) මගේ රට කවි පන්තියේ ඉතිරි කවි කිහිපයක් සොයා, කියවන්න. ගුරුවරයාගේ උපකාරයෙන් අරුත් පැහැදිලි කර ගන්න.